www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අබු ග්‍රයිබ් සහ ඇමරිකානු සමාජයේ අසමර්ථතාව

## Abu Ghraib and the failure of American society

**ඩේවිඩ් වොල්ෂ් විසිනි**
**2004 ජූනි 10**

එක්සත් ජනපද හමුදා භටයන් සහ සිවිල් කොන්ත්‍රාත්කරුවන් ඉරාක රැඳවියන් වධහිංසාවට ලක් කිරීම ''නරක පුද්ගලයන්'' ටික දෙනෙකුගේ ක්‍රියාවල ප්‍රතිඵපලයක් ය යන තර්කය පිළිකුල් සහගතව ප්‍රතික්ෂේප කිරීම අවශ්‍ය ය. ජාත්‍යන්තර රතුකුරුස කමිටුව (අයිසීආර්සී), මාධ්‍යය හෝ එක්සත් ජනපද මිලිටරිය ම කර ගෙන යන බැලූ බැල්මට බැරෑරුම් යැයි පෙනෙන සෑම පරීක්ෂනයක් ම ඇඟිල්ල දිගු කරන්නේ ඉරාක සිරකරුවන් රඳවා ඇති ඇමරිකානු සිර ගෙවල්වල සහ කඳවුරුවල පැතිර පවතින අපහාස කිරීමේ, ත්‍රස්තයේ සහ -- නො දන්නා සිද්ධි ගනනාවක දී -- මිනී මැරීමේ ''ක්‍රමානුකූල'' රටාව පිළිබඳ කරුන දෙසට යි.

කෙසේ වුවත් ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් ''ප්‍රධාන අන දෙන නිලධාරියා'' නිසා අන්තර්ජාතික ගිවිසුම් මගින් හෝ වධහිංසා තහනම් කරන එක්සත් ජනපද නීති මගින් ඔහු සීමා නො වූ බවට තර්ක කරමින් අධිකරන දෙපාර්තමේන්තු නීතිඥයෝ 2002-03 දී ආරක්ෂක ලේකම් ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් සඳහා නීතිමය සටහන් පිලියෙල කලාහු ය යන මෑත සිදු වූ අනාවරනය මෝඩයන් රැවටීමෙන් මුදනු ඇත. ඉරාක ආක්‍රමනයේ පටන් -- ප්‍රසිද්ධියේ ප්‍රකාශ නො කල ද -- වධබන්ධනය එක්සත් ජනපද ආන්ඩුවේ හා මිලිටරියේ නිල ප්‍රතිපත්තිය වී ඇත.

කුරිරු මිලිටරි ආක්‍රමනය මගින් එක්සත් ජනපද භූගෝලීය ආධිපත්‍යය පිහිටුවීම අරමුනු කර ගත් මහා සැලසුමෙහි කොටසක් වූ රටවල් ගිලගන්නා සාපරාධී ස්වභාවයෙන් අවසාන විග්‍රහයේදී රැඳවියන්ට පමුනුවා ඇති දඬුවම්වල ප්‍රචන්ඩත්වය ගලා එයි. අයිසීආර්සීයට අනුව මොවුන්ගෙන් සියයට 70-90 අතර සංඛ්‍යාවක් කැරලි ගැසීම්වලට සහභාගි වී පවා නොමැත. (ලෝකයේ ද විශේෂයෙන් ඇමරිකානු මහජනතාවගේ ද ඇස්වලට වැලි ගැසීම මූලික අරමුන කර ගත්) ඉරාක ජනතාවගේ ''සිත හා හද දිනා ගැනීමේ'' බරපතල වෑයමක් එක්සත් ජනපද හමුදාවන් විසින් දරනු ලබන්නේ ය යන දෙඩවිල්ලෙහි හුලං බැස ඇත.

එක්සත් ජනපද ධන පරිත්‍යාග මත රඳා සිටින වොෂින්ටනයෙන් පෝෂනය වීමට අපේක්ෂිත කොටස් හැරුනු විට ඉරාකයේ ඇමරිකානු මිලිටරි ග්‍රහනය කෙරෙහි විශ්වීය වෛරයක් පවතින්නේ ය යන්න අනුභූතිකව තහවුරු වූ කරුනකි. ඇමරිකානු හා මිත්‍ර හමුදාවන්ට අත් වන සෑම පරාජයක් ම ඉරාකීයයන් විසින් පිලිගනු ලබන්නේ ජනප්‍රිය වනචර සතුටක් සමගිනි. මිලිටරි ආස්ථානයකින් ගත් විට ගැටුම දැනට ම පරාජය වී ඇත. එක්සත් ජනපද හමුදාවලට බිහිසුනු හා කල් පවතින විනාශයක් සිදු කල හැකි ය. එහෙත් ඔවුන්ට තමන් යටතේ ඉරාකය පාලනය හෝ ''ස්ථායීකරනය'' හෝ කිසිදු අර්ථවත් ආකාරයකින් සිදු කල නො හැකි ය.

මිලිටරි රහස් ඔත්තු සේවා ධුරාවලියේ හා බුෂ් පරිපාලනයේ ප්‍රතිගාමී සිවිල් පාලක කල්ලියේ ආස්ථානයෙන් ගත් කල්හි ඉරාක රැඳවුම් කඳවුරුවල පැවති වධබන්ධනවල හා ප්‍රචන්ඩත්වයේ අරමුන ඇති තරම් පැහැදිලි ය. ගැත්තර එක්සත් ජනපදයේ මාධ්‍යයක් විසින් විකාශනය කෙරුනු ඉරාකය පහසුවෙන් ''විමුක්ත කිරීමක්'' හා සන්සුන් කිරීමක් පිළිබඳ බුෂ් පරිපාලනයේ ප්‍රචාරය අවුල් කරමින් පසු ගිය ගිම්හානයේ වර්ධනය වූ හා පැහැදිලි ලෙස පුලුල්ව පැතිර ගිය විරෝධතාව හමුවේ මිලිටරිය, සීඅයිඒ හා බුෂ්ගේ නිලධාරීහු 1950 ගනන් අග භාගයේ ඇල්ජීරියාවේ විජිත විරෝධී අරගලය මැඩීමේ දී ප්‍රන්සය ප්‍රථම වරට වර්ධනය කල ''ඇල්ජියර්ස් අරගලයේ'' ආකෘතිය වෙත යොමු වූහ.

මහා පරිමාන ත්‍රස්තය යොදා ගැනීම මෙම විධික්‍රමය තුල අන්තර්ගත විය: දහස් ගනන් ජනයා මහ මග දී හා මාර්ග බාධකවල දී පැහැර ගනු ලැබුනි.

ඔවුන්ගේ විරෝධය ''මෘදු කිරීම'' සඳහා බිය ගැන්වීම, නින්දා කිරීම හා වධබන්ධනයට ලක් කිරීම සිදු කෙරුනි. විජිත පාලනයට විරුද්ධ ව්‍යාපාරය හා එහි ආධාරකරුවන් පිළිබඳව ඔවුන්ගෙන් ප්‍රශ්න කෙරුනි. විරුද්ධතා ව්‍යාපාරයේ චිත්‍රයක් මේ ආකාරයෙන් ගොඩ නගා ගත් අතර එය හා එහි සාමාජිකත්වය මුලිනුපුටා දැමීමට මිලිටරිය මෙහෙයවනු ලැබුනි.

දීර්ඝ කාලයේ දී මූලෝපායක් ලෙස මෙය ඇල්ජීරියාවේ හෝ වියට්නාමයේ සාර්ථක නො වූ බව සඳහන් කිරීම අවශ්‍ය ය. (වියට්නාම් වැසියන් 20,000ක් ඝාතනයට ලක් වූ සීඅයිඒය විසින් ආදර්ශනය කල අපකීර්තිමත් ෆීනික්ස් මෙහෙයුම නිදසුනකි).

මෙම භීෂනයන්ට සහභාගි වීමට එක්සත් ජනපද මිලිටරියේ සමහර ගැහැනුන් හා පිරිමින් කැමැත්තක් දැක්වීම අවධානයට ලක් විය යුතු ඛේදනීය ප්‍රපංචයක් වේ. මෙසේ වූයේ කෙසේ ද? කුමක් නිසා ද?

සමාජවාදීහු නාසිවාදය වෙනුවට ජර්මානු ''සාමූහික වරද'' යන මතය යෙදීම ප්‍රතික්ෂේප කරන අතර අපි

''නරක ඇමරිකානු'' න්‍යායට -- වෙනත් වචනවලින් කිව හොත් විශේෂයෙන් ම පීඩිත ජනතාවට මුහුන දුන් කල ඔවුන්ට සැලකිය හැක්කේ නො හික්මුනු ප්‍රචන්ඩත්වය මගින් පමනක් ය යන තරමට එක්සත් ජනපද ජනගහනයේ පලල් ස්තරයක් ධවල මන්දිරයේ හා පෙන්ටගනයේ වැදගැම්මකට නැති අධිරාජ්‍යවාදී-ස්වෝත්තමවාදීන්ගේ මානසිකත්වයෙන් දූෂ්‍ය වී ඇතැයි යන්න -- දායක වීමට ලැදියාවක් නැත්තෙමු.

අබු ග්‍රයිබ්හි හා අනෙකුත් රැඳවුම් මධ්‍යස්ථානවල දී ඉරාකීයයන් දහස් ගනනක් වෙත එල්ල කෙරෙන බියකරු අපචාරයන් සඳහා විරෝධය පෑමට අසමත් ජන කොටසක් නිර්මානය කරන නියත වසයෙන් ම සුවිශේෂ සමාජ හා ආර්ථික ක්‍රියාවලීන් පන ගැන්වී ඇත.

යමෙකුට මුලින් ම හමු වන්නේ හමුදාවන්හි ''ස්වේච්ඡා'' ස්වභාවය මගින් ඉටු කරනු ලබන ක්‍රියා කලාපය යි. හු තලය සිසාරා ක්‍රියාවට නැගෙන සාපරාධී, ලේ වැකි කඩා පැනීම්වලින් නො පැකිලෙන සටන්කාමී හමුදාවක් එක්සත් ජනපද පාලන තන්ත්‍රයට අවශ්‍ය ය. සාමාන්‍ය පුරවැසියාගේ ප්‍රගතිශීලී සමාජමය සංකල්පවල හෝ හැඟීම් හා විවේචනාත්මක මතවාදයන්ට එරෙහිව හැකි තාක් දුරකට භටයන් ප්‍රතිශක්තිකරනය පූර්වකොන්දේසිය වේ. නවකයන් දැනුවත්ව ම ඔහුගේ හෝ ඇයගේ සමාජ පරිසරයෙන් ඉවත් කොට හුදෙකලා කර දැඩි විනයකට යටත් කෙරේ.

තව ද, වෛෂයිකව සැලකු කල, කන්ඩායමක් ලෙස සොල්දාදුවන් ගත් විට ඇමරිකානු සමාජයේ වෙනස් වීම් පිලිබිඹු කල යුතු ය. එනම් පොදු සදාචාරාත්මක හා සංස්කෘතික පරිහානිය හා ලොකු හා කුඩා නගරවල එකසේ ජනගහනයේ සමහර කොටස් අපන්තික වීම යි. කාලයක් තිස්සේ පැවතෙන සිය ආර්ථික හා සමාජ මූලයන් ඉරී ගිය ජන කන්ඩායම්වලින් කොපමනක් ඇදී එයි ද? විෂමාචාරී පවුල්වලින් ද මග ඇවුරුනු ජීවිත ගත කරන්නන් ද අතරින් කොපමනක් ඇදී ඒ ද?

සමස්ත ඉරාක යුද්ධය ම බේගල් මත පදනම්ව දියත් කල ම්ලේච්ඡ යුද අපරාධයකි. අන්ධ දේශමාමකත්වයේ හා ස්වෝත්තමවාදයේ නිශ්චිත වටපිටාවක් නිර්මානය කර ඇත. මත විමසීම්වලට අනුව එක් අවස්ථාවක දී එක්සත් ජනපද ජනගහනයෙන් සියයට 70ක් දෙනා සැප්තැම්බර් 11 දා ත්‍රස්ත ප්‍රහාරවලට ඉරාකීයයන් වගකිව යුතු බව විශ්වාස කලහ. ඉරාකයෙහි රඳවා ඇති එක්සත් ජනපද හමුදාවන්ගෙන් සැලකිය යුතු කොටසකට තමන් ''ත්‍රස්තවාදීන්'' සමග සටන් කරන්නේ ය යන අදහස අලෙවි කර ඇති බව නිසැක ය. තමන් මුහුන දෙන තත්වයට කිසි සේත් සූදානම් නො වූ, නුපුරුදු හා සතුරු පරිසරයකට දක්කා ඇති ඇමරිකානු භටයෝ භීතියට, වෙහෙසට හෝ අධෛර්යට පත් වීම නිසා අපරාධ ඕනෑ ම ප්‍රමානයක් සිදු කිරීමට සමත් වෙති.

සටනෙහි යෙදෙන හමුදාව ඇතුලත තවත් එක් තේරීමක් කෙරේ. රැඳවියන් බලා ගන්නා පොලිස්කාරයෙකු හෝ ආරක්ෂකයෙකු වීමට සෑම කෙනා ම සුදුසු නො වේ. සමහරුන්ට ඒ සඳහා පසුබිමක් ඇත. අනෙදෙන නිලධාරියා නිවැරදි මානසිකත්වය යැයි සලකන දෙය සමහරුන් සතු ය.

අවසානයේ දී පුද්ගලයා කවරෙකු වුව ද කවර අහම්බ සිදුවීම් ඇති වුව ද අබු ග්‍රයිබ් කඳවුරේ ම්ලේච්ඡ ක්‍රියාවන් සිදු කල අපරාධකරුවෝ ඇමරිකානු සමාජයේ හා සංස්කෘතියේ, වඩාත් නිවැරදිව කිව හොත් එහි අසාර්ථකත්වයේ නිෂ්පාදනයක් වෙති.

## කිසිවක් දී නැත

ප්‍රසිද්ධ කරන ලද ඡායාරූපවල නිරූපිත ඉරාක සිරකරුවන්ට කල විශේෂ ලෙස ''කෲර වූ ලිංගික අපචාරයන්ගේ'' ස්වභාවය සංස්කෘතික දුගී භාවයේත් අන්තරායදායක මට්ටම් කරා ලඟා වී ඇති පසුගාමිත්වයේත් මට්ටමක් පිලිබඳව කතා කරයි. ඔවුන්ගේ මිලිටරි අරමුන කුමක් වුව ද සිදු කල ක්‍රියාවන් ඇඟවුම් කරන්නේ ඒවාට වගකිව යුත්තන් මානව සංවර්ධනයේ තීරනාත්මක අදියරක් පසු කර යාමට අසමත්ව ඇති බවත් අත්හිටුවා ඇති සංවර්ධනයෙන් ඔවුන් පීඩා විඳින බවත් ය.

අනාරක්ෂිත සිරකරුවන් ප්‍රතිදීප්ත ආලෝකයෙන් හා අඳුරු කෙවිටිවලින් ලිංගික අපචාරයට ලක් කල පිරිමින් හා ගැහැනුන් පිලිබඳව අපට ගත හැකි නිගමනය කුමක් ද?

මේ උපුටා දක්වන්නේ අබු ග්‍රයිබ්හි වධබන්ධනයන් පිලිබඳව *වොෂින්ටන් පෝස්ට්හි* පල වූ වාර්තාවකිනි:

''අංක 150542 දරන මුස්තාෆා ජාසිම් මුස්තාෆා නමැති රැඳවියා හමුදා පරීක්ෂකයන්ට කීවේ ප්‍රතිදීප්ත ආලෝක ප්‍රහාරයට තමන් ද සාක්ෂි දරන බව යි. පහල සිර කුටියකින් කෑ ගැසීම් ශබ්ද ඇසුනේ මුස්ලිම් වසරේ ශුද්ධ වූ රාමසාන් කාලය තුල බව ඔහු කීවේ ය. සොල්දාදුවන් කන්ඩායමක් රැඳවියෙකු බිම දමා අල්ලා ගෙන ආලෝක ධාරාවලින් ඔහුට ලිංගික අතවරයන් කරන ආකාරය තමන් පහත බැලූ විට දුටු බව මුස්තාෆා කී ය.

''(විශේෂඥ චාල්ස්) ග්‍රැනර් ප්‍රතිදීප්ත ආලෝකය මගින් රැඳවියාට ලිංගික අතවර කරමින් සිටි බව මුස්තාෆා කී ය. රැඳවියා 'උදව් ඉල්ලා කෑ ගසමින් සිටියේ ය. ග්‍රැනර් සමග සිටි තවත් උස සුදු ජාතික පිරිමියෙක් ඔහුට උදව් කරමින් සිටියේ ය. සුදු ජාතික මිටි කාන්තා සොල්දාදුවෙක් ඡායාරූප ගනිමින් සිටියා ය.'

''තවත් රැඳවියෙකු හමුදා පරීක්ෂකවරුන්ට පැවසුවේ ඇමරිකානු සොල්දාදුවන් තමන්ට පහර දී ලිංගික අතවර කල බව යි. ලිංගික අතවරවලට ලක් වූවෙකු නිසා එම පුවත්පත ඔහුගේ නම හෙලි කර නැත. මුල් වරට තමා අබු ග්‍රයිබ් වෙත පැමිනීමෙන් පසුව දින පහක් නිරුවත්ව තැබූ බවත් හිස් ආවරනයක් දමා පැය හතරක් දන ගසා ගෙන සිටීමට බල කල බවත් ඔහු පැවසී ය. එක්

දිනක් තම හිස් ආවරනය ගැලවී වීසි වන තෙක් තමන්ට පහර දුන් බව ද ඔහු කීවේ ය. 'පොලීසිය අරාබි බසින් මට බඩ ගෑමට අන කල විට මම එසේ කලෙමි. පොලිසිය මගේ ඇඟට කෙල ගසා මගේ පිටු පසට, ඔලුවට හා යටි පතුල්වලට පහර දුන්හ' යි ඔහු තම දිවුරුම් ප්‍රකාශයේ කී ය.

''එක් දිනක් ඇමරිකානු සොල්දාදුවන් තමා බිම දමා අල්ලා ගෙන තම දෙපා ඇත් කල බවත් එක් හටයෙකු තම කලිසම විවෘත කිරීමට සූදානම් වූ අතර 'මම කෑ ගැසීමට පටන් ගතිමි' යි එම රැඳවියා ප්‍රකාශ කලේ ය. සොල්දාදුවන් තම හිස මත නැගී සිටිය දී අයෙකු ෆොස්ෆරික් බල්බයක් කඩා තමන් මත රසායනික ද්‍රව්‍ය වත් කල බවත් ඔහු කී ය.

'' 'මම දිලිසුනා, ඔවුන් සිනා සෙමින් සිටියා' යි ඔහු කී ය.

''සොල්දාදුවන් අවසානයේ දී තමා කාමරයකට රැගෙන ගිය බවත් කෝටුවකින් ලිංගික අතවරයට ලක් කල බවත් රැඳවියා කී ය. 'මේ සියල්ල සිදු වෙද්දී ඔවුන් මගේ පින්තූර ගත්තා' යැයි රැඳවියා පරීක්ෂකයන්ට පැවසී ය.''

ප්‍රචන්ඩත්වයේ හා ලිංගික අපචාරයේ මිශ්‍රනය අංගලක්ෂනය කරනුයේ ඇමරිකාව තුල ෆැසිස්ට්වාදී මාඉම යි. මෙම සමාජ මූලයේ මානසිකත්වයෙහි දසුනක් පාඨකයා වෙත සැපයීම සඳහා දක්ෂිනාංශිකයන්ගෙන් අප වෙත ලැබෙන විදුලි තැපැලෙන් කොටසක් *ලෝසවෙඅභි* පල කිරීමට අපි කිහිප වතාවක් ම අවධානය යොමු කර ඇත්තෙමු. එම තැපැලෙන් වැඩි කොටසක් නූගත්, අසභ්‍ය හා තර්ජනාත්මක ඒවා ය.

අබු ග්‍රයිබ් නඩුවේ චූදිතයන් බුද්ධිමය, චිත්තවේගී, සෞන්දර්යමය කිසිවක් දෙනු ලැබ නැත. මෙය හුදෙක් අධ්‍යාපනයේ අඩුවක් පිලිබඳ කරුනක් නො වේ -- අද බොහෝ ඇමරිකානුවන් පටු ම අර්ථයෙන් පමනක් සාක්ෂරතාවයෙන් යුත් අය වුව ද -- එය ඥානන සන්තතියේ බිඳ වැටීමකි. ඉරාක සිරකරුවාගේ හෝ අනෙකෙකුගේ තත්වය සංකල්පගත කර ගැනීමට හා මූලික මානව අනුකම්පාව අත්දැකීමට ඇති නො හැකියාව තුල මෙය විද්‍යාමාන වේ. මෙයින් පිලිබිඹු වන්නේ සමාජ පරත්වාරෝපනයේ තියුනු මට්ටමකි.

දැනට මත් දඬුවම් ලබා සිටින සමහරුන්ගේ චරිතාපදානයන් වෙත කෙටි බැල්මක් හෙළීම අර්ථවත් ය. මොවුන් සත් දෙනාගේ කන්ඩායම බෙහෙවින් පීඩිත පුද්ගලයන්ගෙන් සැදුම් ලත් එකකි. එමෙන් ම බන්ධනාගාර, පොලිස් කටයුතු සම්බන්ධ පසුබිමක් සහිත ය. මෙය ප්‍රචන්ඩත්වයට නැඹුරු වීමේ හැකියාවක් සහිත මිශ්‍රනයකි.

21 හැවිරිදි පීඑෆ්සී (පලමු පෙල සාමාන්‍ය සෙබලියක්) ලින්ඩී ඉංග්ලන්ඩ් ඉරාක රැඳවියන් සම්බන්ධ ඇයගේ රාගාන්විත හැසිරීම ගැන අපකීර්තිමත්ව ඇත. එක් ඡායාරූපයක තොල් මත රඳවා ගත් සිගරැට්ටුවක් හා දිලිසෙන ඇස් සහිතව ඇය හිස වසා ඇති නිරුවත් සිරකරුවෙකුගේ ලිංගේන්ද්‍රියන් පෙන්වමින් සිටියි. තවත් එකක නිරුවත් ඉරාක ජාතිකයන්ගේ පිරමීඩයක් පිටුපස ඇයගේ පෙම්වතා වන විශේෂඥ ග්‍රැනර් සමග අතිනත ගෙන සිට ගෙන සිටී. දෙදෙනා ම විරිත්තමින් මාපට ඇඟිල්ල ඔසවා සංඥා කරමින් සිටිති. තුන් වන ඡායාරූපය පෙන්නුම් කරන්නේ ඇය නිරුවත් සිරකරුවෙකු රැහැනකින් මෙහෙයවමින් සිටින ආකාරය යි.

*වොෂින්ටන් පෝස්ට්* පුවත්පතට අනුව:

''යුද හමුදාවට සම්බන්ධ වීම ප්‍රථම ස්ථානයේ ලා තැබූ ඉංග්ලන්ඩ් යුද්ධයට යාමට තීරනය කලා ය. පැරනි ගල් අඟුරු ආකර නගරයක් වූ ෆෝර්ට් ඇෂ්බි ඩබ්ලිව්.වී.හි (1,300ක ජනගහනයකින් යුත් නගරයකි) වයස අවුරුදු 17ක කනිෂ්ට පාසල් ශිෂ්‍යාවක වූ ඇය තමන්ට හමුදාවට බැඳීමට අවශ්‍ය බව කියා සිටිමින් සිය පවුල වෙත පැමිනියා ය. බාල වයස්කාරියක වූ ඇයට ඒ සඳහා සිය දෙමාපියන්ගේ කැමැත්ත අවශ්‍ය වූ අතර ඔවුහු මුලින් ඊට විරුද්ධ වූහ.

''උස අඩි පහයි අඟල් දෙකක් වූ ඇගේ බර රාත්තල් සියයකට වැඩි නො වී ය. එහෙත් ඇය දැඩි සිතින් යුතු වූවා ය. 'තමන්ට ඉක්මනින් ම වයස 18 වන බවත් එවිට එය කරන බවත් ඇය කී' බව ඇයගේ පියා වන කෙනත් ඉංග්ලන්ඩ් පැවසී ය.

''එහෙත් ඇගේ මෙම තීරනය බොහෝ දුරට මෙහෙයවනු ලැබුවේ කාලගුන විද්‍යාව හැදෑරීම සඳහා විද්‍යාලයකට යෑමට ඇති ආශාව විසින් බව ඇයගේ ඥාතීහු පැවසූහ. උපකාරක ඉගැන්වීම් සඳහා මිලිටරියෙන් උදව් ලබා ගත හැකි බව ඇය දැන ගත්තේ හමුදාවට බඳවා ගන්නා දැන්වීම් දැකීමෙනි.'' කැඳවීම ලැබෙන තාක් ඉංග්ලන්ඩ් කුකුල් මස් සැකසීමේ කම්හලක වැඩ කලා ය.

අපචාරයන් පිලිබඳව වරද පිලිගෙන පාපොච්චාරනය කල එක ම සෙබලා 24 හැවිරිදි විශේෂඥ ජෙරමි සිවිට්ස් ය. ඔහු පෙන්සිල්වේනියාවේ හින්ඩ්මාන් ගම්මානයෙන් පැමිනි අයෙකි. ඔහුගේ පවුල එහි පැමිනෙන විට, ''ව්‍යාපාරික නැවතුම් පොලක් ලෙස නො සලකා හින්ඩ්මාන් දුම්රිය පොල මග හැර යාමට දුම්රිය එවන විටත් පටන් ගෙන තිබුනි. වරක් ප්‍රදේශයේ ආර්ථිකය පන ගැන්වූ දුම්රිය මාර්ග රැකියා අහෝසි විය. ... නගරය එක් වීදියකට සීමා වූ අතර එයට පයිප්ප දෙකේ ගෑස් පිරවුම් හලක්, බැංකුවක්, පැරනි වාහන අලෙවි මධ්‍යස්ථානයක් හා රතු පාට දැල්වෙන මාර්ග සංඥාවක් අයත් විය. එය වේලුනු නගරයකි: මත්පැන් විකිනීම තහනම් වී'' යැයි *පෝස්ට්* පුවත්පත වාර්තා කරයි.

''ජෙරමි සිවිට්ස්ගේ මව වන ෆ්‍රීඩා සිවිට්ස් නගරයෙන් බැහැර ඩොලර් ජෙනරල් ගබඩාවේ සේවය කරයි. එහි අයකැමියන් ද 1,500ක් වන හින්ඩ්මාන් වැසියන්ගෙන් බොහොමයක් මෙන් ම ඕපාදූප දෙඩවීමෙන් සතුටු වෙති.'' කුඩා විශ්‍රාම වැටුපකින් ජීවත් වන සිවිට්ස්ගේ පියා වියට්නාම් යුද ප්‍රවීනයෙකි. ඔහුගේ මාමා එම

යුද්ධයේ දී මිය ගොස් තිබුනි. ගුරුවරියක ජෙරමි ගැන විස්තර කලේ ''පසුගාමිත්වයට බර අයෙකු ලෙස'' යි. ''දුර්වර්න, සෙලවෙන තිර දොරක් හා දුම්රිය මාර්ග හරහා දිවෙන එල්ලා වැටෙන මඩුවක් සහිත ගරාදි නිවසක'' පවුල ජීවත් වෙයි.

*පිට්ස්බර්ග් පෝස්ට්-ගැසට්* පුවත්පත සඳහන් කරන්නේ 372 වන මිලිටරි පොලිස් සමාගම පිහිටි මේරිලන්ඩ්වල ක්‍රෙසප්ටවුන්හි විශාලතම සේවා යෝජකයා ''ප්‍රාන්ත බන්ධනාගාරයක් බව යි. හුවමාරු කල හැකි දක්ෂතා සහිත හමුදා භටයන් සැපයීම ද එය සිදු කරයි. 'නාගරිකයේ සැලකිය යුතු කොටසක් එහි සේවය කරන' බව පොලිස් හා ආරක්ෂක උපකරන අලෙවි කරන කුඩා ගබඩාවක් පවත්වා ගෙන යන කර්ට් ට්‍රින්ග්ලර් පැවසී ය.'' දඬුවම් ලැබූ හත් දෙනාගෙන් තිදෙනෙකුට ම පොලිස් හෝ බන්ධනාගාර සබඳතා ඇත.

වර්ජිනියාවේ ඇලෙක්සැන්ඩ්‍රියාහි 26 හැවිරිදි විශේෂඥ සබ්රිනා හාර්මන් පොලිස් අපරාධ පරීක්ෂකවරයෙකුගේ දියනිය යි. CBSNEWS.com වෙබ් අඩවියට අනුව ඇගේ පියා ''පවුලේ 'දැන ගැනීම' සඳහා අපරාධ ජවනිකා සහිත ඡායාරූප නිතර නිවසට ගෙන ආවේ ය.''

ඇයගේ මව වන රොබින් හාර්මන් වාර්තාකරුවෙකුට කීවේ, ''ඇය කුඩා කල පටන් ම මරන පරීක්ෂන හා අපරාධ ජවනිකා ඇතුලත් ඡායාරූප නැරඹූ'' බව යි. ...

''ඉරාකයට යැවීමට පෙර ඇය සහකාර කලමනාකාරියක ලෙස පපා ජෝන්ස් පීසා වෙලඳ සලෙහි වැඩ කල අතර ඇයගේ පියා මෙන් ම අපරාධ පරීක්ෂකවරියක වීමේ සිහින දුටු බව ඇයගේ මව පවසයි.''

වර්ජිනියාවේ බකිංහැම්හි 37 හැවිරිදි මාන්ඩලික සැරයන් ඉවාන් ෆෙඩ්රික් රැකියාව කලේ ඩිල්වින්හි ප්‍රාන්ත බන්ධනාගාරයේ යහමග යැවීමේ නිලධාරියෙකු ලෙස ය. පවුලේ සාමාජිකයන් ද කියවන සඟරාවකට ප්‍රකාශයක් කරමින් ඉරාකයේ දී තමන්ට මුන ගැසුනු වර්ගයේ සිරකරුවන් සමග ගනුදෙනු කිරීමට තමන් නුසුදානම්ව සිටි බවත් එහි දී සිරකරුවන්ට අතවර සිදු වූ බවත් ඔහු පිලිගත්තේ ය. ඔහු හැදීවැඩී ඇත්තේ සිය මාමාගේ ගුවන් හමුදා වෘත්තිය ආදර්ශයට ගනිමිනි. ඔහුගේ බිරිඳ ද බන්ධනාගාර නිලධාරිනියකි.

පෙන්සිල්වේනියාවේ යුනියන්ටවුන්හි 35 හැවිරිදි විශේෂඥ චාල්ස් ග්‍රැනර් පෙන්සිල්වේනියාවේ ග්‍රීන් කවුන්ටිහි උපරිම ආරක්ෂක බන්ධනාගාරයක නිලධාරියෙකි. ඔහුගෙන් වෙන්ව සිටි බිරිඳ 1997 පටන් අපචාර චෝදනාවලින් ආරක්ෂා වීමේ තාවකාලික නියෝග 3ක් ලබා සිටියා ය. එහි පලමු නියෝගය සඳහා ඉදිරිපත් කල දිවුරුම් පෙත්සමක ස්ටේසි ග්‍රැනර් ප්‍රකාශ කලේ, චාල්ස් ග්‍රැනර් තමා මරන බවට තර්ජනය කල බවත් ''ඒ සඳහා ඔහුට තුවක්කු අවශ්‍ය නැති බැවින් ඇයට ඔහුගේ තුවක්කු තබා ගැනීමට'' කී බවත් ය. විනිශ්චයකරු මොවුන් තම දරුවන්ගේ භාරකාරත්වය මාරු කර ගැනීම පොලිස් ස්ථානයේ දී කල යුතු යැයි නියෝග කලේ ය. තම ස්වාමියා ''තමාගේ අනුදැනුමකින් තොරව නිවසේ වීඩියෝ කැමරාවක් සවි කර එහි ඡායාරූප තමන්ට පෙන්වූ බවත්'' ස්ටේසි ග්‍රැනර් චෝදනා කලා ය.

සංස්කෘතිකමය පසුගාමිත්වය ඇමරිකාවෙහි බහුලව දැකිය හැකි වන අතර කුඩා නගර හා නගරවල තරම් අන් කිසි තැනක එය පැතිරී නැත. සංගතයෝ විසින් කම්හල් හා පතල් වසා දමා මෙම ප්‍රදේශ කාබාසීනියා වීමට අත හැර වඩා ලාභදායී බිම්පෙත් කරා ඇදී ගියහ. පිරිවැය කපා හැරීම නිසා ආධ්‍යාපනික හා සාමාජීය වැඩ සටහන් පාලුවට ගොස් ඇත. අන් සියල්ල තිබිය දී චිත්‍ර කලාව හා සංගීතය ප්‍රසිද්ධ පාසල්වලින් ඉවත් කර ඇත. මෙමගින් සහතික කෙරෙන්නේ වෘත්තීය සමිති විසින් නො සලකා හැරී ඇති හා දේශපාලනඥයන් විසින් අත් හැර දැමී ඇති කප්පාදු කල බුද්ධි මට්ටමකි. චීනයේ සමහර හුදෙකලා ගම්මාන මෙන් ආධ්‍යාත්මිකව හා සදාචාරාත්මකව මේවා පාලුවට ගොස් ඇත. සැබවින් ම බාහිර ලෝකයට මේවා සම්බන්ධ වී ඇත්තේ මූලික වසයෙන් රූපවාහිනියේ මුග්ධත්වයනුත් ('යථාර්ථ දර්ශන,' පොලිස් ක්‍රියාකාරකම්, දිවා කාලයේ සංවාද දර්ශන) දක්ෂිනාංශික කතා ගුවන්විදුලියේ අනන්මනනුත් හරහා ය. -- මෙම නගරවලින් ඉදිරිපත් කරන්නේ ඉතා අල්ප පොරොන්දුවකි. බොහෝ දෙනෙකුට විශේෂයෙන් තරුනයන්ට හිමිව ඇත්තේ අනාගතයකින් තොර අඳුරු ජීවිත ය.

මහා මාර්ගයෙන් හැරී පෙන්සිල්වේනියාහි ඩියුබොයිස්, වොෂින්ටන්හි බ්ලේන්, මිචිගන්හි ඇඩම්ස්විල් හෝ ඇරිසෝනාහි කිංග්මන් පසු කර ගිය හොත් ඇමරිකානුවන් බොහෝ දෙනෙකු දැනට මත් ජීවත් වන්නේ අවපාත තත්වයන් යටතේ යැයි ඔබ නිගමනය කරනු ඇත. මිලියන ගනන් මිනිසුන් ගත කරන්නේ දුෂ්කර දිවි පෙවෙතකි, රැකියා දෙකක් හෝ තුනක් කරති. නය බරින් මිරිකී ඇත, දුර්වර්න වූ ලැලි ගැසූ නිවාස හා කම්හල්, මලකඩ කමින් තිබෙන යන්ත්‍රසූත්‍ර, හා පාලුවට ගිය කුඩා වීදිවලින් ප්‍රකාශිත වන්නේ අමාරු කොන්දේසි යටතේ ලබා ගන්නා පඩි පතක භෞතික තත්වය යි.

පදිංචිකරුවන් 40,000කට අඩු යැයි ගනන් බලන ලද කුඩා නගර ඉරාක යුද්ධයෙන් අසීමිත පීඩාවකට පත්ව ඇති බව *සේන්ට් ලුවිස් පෝස්ට්-ඩිස්පැච්* පුවත්පතේ මෑත වාර්තාවකින් පෙන්නුම් කරයි. ඝාතනයට ලක් වූ 800ක් පමන වූ එක්සත් ජනපද සෙබලුන්ගෙන් 46%ක් පමන දෙනා එවැනි ප්‍රදේශවල අය වෙති. මෙම ප්‍රදේශවල ජීවත් වන්නේ ඇමරිකානු ජනගහනයෙන් 27%ක් පමනි. මොවුන් හමුදාවට බැඳීමේ අවස්ථාවන් හිඟකම විසින් දුවවනු ලබන, ''ආර්ථික හේතුවල බලපෑමට'' හසු වූවන් ය. මෙම කොටස්වලින් නිශ්චිත ප්‍රතිශතයක් අබු ග්‍රයිබ්හි සිදු

කලාක් වැනි අපරාධ කිරීමේ හැකියාවක් සහිතව මතු වී එයි.

ඔවුන් මත යෙදෙන ප්‍රමුඛ බලපෑම වන්නේ බැප්ටිස්ට් හා ක්‍රිස්තියානි මූලධර්ම වර්ගයේ ආගම යි. ඉරාක සිර ගෙවල් තුල දී කනපිට පෙරලී ඇත්තේ මොවුන්ගේ සිත් තුල මැඩ ගෙන තුබූ ලිංගික පාර්ශ්වය යි. දශක ගනනාවක් තිස්සේ දක්ෂිනාංශික උද්ඝෝෂකයන්ගේ හොලිවුඩ් චිත්‍රපට මගින් ජනතාව මත වගුරුවා ඇති ස්වෝත්තමවාදයේ හා විදේශිකයන් නො රිස්සීමේ වස විස එහි පලිය ගනිමින් තිබේ. ඉරාකීයයන්ට අමානුෂික ලෙස සැලකිය යුතු ය යන්න සමහරුන් වෙත ලෙහෙසියෙන් ම කාන්දු වී ඇත්තේ මෙලෙස ය.

එක් ඉරාක රැඳවියෙකු පරීක්ෂකයන්ට පැවසුවේ සෙබලෙකු ''තම කැඩුනු කකුලට ගසමින් හා ඉස්ලාම් ආගමට සාප කරන ලෙස කියමින් දිගට ම තමන්ට හිරිහැර කල බව යි. 'ඔවුන් මගේ කැඩුනු කකුලට ගැසීමට පටන් ගත් නිසා මම මගේ ආගමට සාප කලා' ඔහු කී ය. 'මම පන පිටින් සිටීම ගැන ජේසුන්ට ස්තුති කරන ලෙස ඔවුන් මට නියම කලා.' සෙබලුන් තමා ඇඳකට තබා මාංචු දැමූ බව රැඳවියා කී ය. 'නුඹ කිසිවක් විශ්වාස කරනවා ද?,' සෙබලා ප්‍රශ්න කලේ ය. ''මම අල්ලා ගැන විශ්වාස කරනවා,'' මම ඔහුට කීවෙමි. ''ඒත් මම විශ්වාස කරන්නේ වධ දීම් ගැනයි. ඒ නිසා මම නුඹට වද දෙනවා'' යැයි එවිට ඔහු පැවසී ය.

## හවුල් වගකීමක්

මෙම දූෂිත තත්වයට වගකීම රැඳී ඇත්තේ කොහි ද?

සමස්ත දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය, දේශපාලන පක්ෂ, විනෝද සැනකෙලි කර්මාන්තය හා ජනප්‍රිය සංස්කෘතිය ද බුද්ධි ජීවීන් ද මත මෙය රැඳී ඇත.

මුග්ධත්වය හා පරපීඩා කාමුකත්වය ඇරඹෙන්නේ ඉහලින් ම ය. දක්ෂිනාංශිකයෙකු වන ටකර් කාල්සන් වාර්තා කොට ඇත්තේ තමන් ටෙක්සාස් ආන්ඩුකාර ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ්ගෙන් එවකට තීන්දුව දීමට නියමිතව තිබූ කාර්ලා ෆායේ ටකර්ගේ දඬුවම ගැන විමසූ බව යි. බුෂ් ප්‍රතිචාර දැක්වූයේ ටකර් සීඑන්එන්හි ලැරී කිංට දී තිබූ සම්මුඛ සාකච්ඡාවක් උපහාසයට ලක් කරමිනි. ''කරුනාකර මාව මරන්න එපා'' යි සමච්චල් සහගත සාහසිකත්වයකින් බුෂ් කෙඳිරි ගෑවේ ය.

කුඩා ප්‍රජාවන් තුල පමනක් නො ව පොදුවේ බොහෝ ඇමරිකානුවන් ගෙන යන්නේ දිළිඳු දිවි පැවැත්මකි. බෙහෙවින් කෙලෙසුනු හා වානිජ්‍යකරනය වී ඇති පොදු සංස්කෘතිය ආත්මාර්ථකාමිත්වය, පුද්ගලවාදය හා කෑදරකමින් වෙලී ඇත. ''ක්වෙන්ටින් ටැරන්ටිනෝහි'' අර්ධඅරාජක වර්ගයේ වේවා මෙල් ගිබ්සන්ගේ ඉවැන්ජෙලික කතෝලික ධර්මයේ ස්වරූපයෙන් වේවා ''ලිංගික පරිපීඩනය හා කාමුකත්වය'' චිත්‍රපටවල උපශෛලියක් වී ඇත. ලිංගිකත්වය පවත්වා ගෙන යන්නේ සියල්ල පොලඹවා ලන පාරිභෝගික භාන්ඩයක් ලෙසට යි. *නිව් යෝක් ටයිම්ස්* සඟරාවේ මෑත දී පල වූ සටහනකට අනුව තරුන පෙල අතර ලිංගික සබඳතා වඩාත් ඇල්මැරුනු හා ඕනෑවටඑපාවට සිදු කරන්නක් බවටත් අසභ්‍ය කාම සාහිත්‍යය ඩොලර් බිලියන ගනන් වූ ව්‍යාපාරයක් බවටත් පත්ව ඇත. කැසිනෝ හා ලොතරැයි ඒවා උත්තේජනය කල සියලු ම සිහින ලෝකයන්ගේ ආධාරයෙන් පැතිර යයි. ක්ෂනික ආහාර අවන්හල් හා නිරුවත් සමාජ ශාලාවලින් වටපිටාව දූෂිත වී ඇත.

අතෘප්තිය, නො සන්සුන්කම හා කැකෑරෙන කෝපය පවා ව්‍යාප්ත නො විය හැක්කේ කෙසේ ද?

මේ සියල්ල මධ්‍යයේ ධනවතුන් හා දූෂිතයන් විසින් ආධිපත්‍යය පවත්වන දේශපාලනය පෙනී යන්නේ මුලුමනින් ම දුරස්ථ හා සතුරු විෂය පථයක් ලෙස යි. මාධ්‍ය කතා කරන්නේ සමාජය මුදුනේ සිටින තනි වූ හා හුදෙකලා වූ අතලොස්සක් වෙනුවෙන් සහ අතලොස්සකට ය. බියගුලුකමින් ද නිවටකමින් ද හෙබි ඊනියා ලිබරල් බුද්ධිමතුන් අන්ත දක්ෂිනාංශික ජීවන මාර්ගයකට ඉඩකඩ සලසා ඇත.

අබු ග්‍රයිබ්හි වර්ගයේ අපරාධ සිදු කල හැක්කේ තමන් ජීවත් වන සමාජයෙන් සදාචාරාත්මක හෝ සංස්කෘතිකමය කිසිවක් ලබා නොමැත්තා වූ මිනිසුන්ට පමනි. වෙන කිසි දාකට වඩා දැන් එක්සත් ජනපද හමුදාවට සිය කැත වැඩ කිරීමේ දී මෙවන් සමාජ කොටස්වල අවශ්‍යතාව පැන නැගී ඇත.

අනතුරු හැඟවීමක් කල යුතු යː වර්ධනය වන වෘත්තීය ''සිවිල්'' කුලී භටයන්ගේ හමුදාවක් විසින් සහාය දෙනු ලබන මිලිටරියක් මැද පෙරදිග, මධ්‍යම ආසියාවේ හා අනෙකුත් ස්ථානවල පීඩිත ජනතාවන්ට පමනක් නො ව එක්සත් ජනපද මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට ද අන්තරායකි. ඇමරිකානු ජනතාවගේ විරෝධය පුලුල් පදනමක් සහිත තර්ජනාත්මක ව්‍යාපාරයක් ලෙස මතුව ආ විට එම කොටස ම ඔවුන්ට එරෙහිව බලමුලු ගැන්වෙනු ඇත.

විවිධ මිලිටරි පරීක්ෂනයන් හා කොංග්‍රස් මන්ඩල කරනු විමසීම් ඇමරිකානු සමාජය තුල හා එක්සත් ජනපද මිලිටරිය තුල එවැනි අහිතකර ප්‍රවනතා වර්ධනය වීම නැවැත්වීමට කිසිවක් නො කරනු ඇත. ඊට ප්‍රතිවිරුද්ධව පසුව සඳහන් කරන ලද දේ ගැටලුවේ ගැඹුරු හා 'විධිමත්' මූලයන් සැඟවීමට උත්සාහ දරන සැලසුම් කල මහජන සබඳතාවන් පමනි.

ඉරාක සිර ගෙවල් තුල වධබන්ධන ඇතුලු උමතු ක්‍රියාවලට ප්‍රතිඋත්තරය වන්නේ ප්‍රචන්ඩත්වයේ හා මර්දනයේ මූලාශ්‍රය වන ධනවාදයේ කුනු වූ පදනම් වෙත යොමු කරන කම්කරු පන්තියේ ශක්තිමත් ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැංවීම යි. ජනතා සමාජවාදී ව්‍යාපාරයක් එක්සත් ජනපදය තුල සමානාත්මතාවයේ හා ප්‍රජාතන්ත්‍රවාදී චින්තනයේ

හොඳ ම සම්ප්‍රදායන් කැඳවනු ඇති අතර මිලියන ගනන් මිනිසුන් ශ්‍රේෂ්ඨ පරමාදර්ශයන්ගෙන් ප්‍රබෝධමත් කරනු ඇත.

අබු ග්‍රයිබ් භීෂනයන් ඇමරිකාවේ හා පෘථිවි ගෝලය පුරා මහජනතාව මුහුන දී සිටින විකල්පයන් තියුනු ලෙස අනාවරනය කරයි: සමාජවාදය ද? ම්ලේච්ඡත්වය ද?

© www.wsws.org